# වැඩතහනමට අවුරුදු දහයයි ආණ්ඩුවට අවුරුද්දයි[i]

රටේ ප්‍රශ්නයක් සමග මගේ පෞද්ගලික ප්‍රශ්නයක් පටලවා ගන්නේ ඇයි දැයි ඇංකර ප්‍රබුද්ධයකු ඇසීමට ඉඩ ඇත. එයට පිළිතුර මගේ පිනකට මා ප්‍රබුද්ධයකු නොවීමය. උක්ත මාතෘකාව මගේ ඔළුවට දැම්මේ පුවත් පතෙහි ප්‍රධාන කර්තෘ මහතා ම වීම මෙහි ඇති විශේෂත්වයයි. කිසි විටෙක ලිවිය යුත්තේ කුමක් දැයි නොකියන ඒ මහතා සමග කතා කරමින් සිටිය දී මාතෘකාව ඉදිරිපත් විණි. එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව පිහිටුවා පසුගිය පස්වැනිදාට අවුරුද්දක් සම්පූර්ණ විය. කොළඹ විශ්ව විද්‍යාලයෙන් මගේ වැඩ තහනම් කරනු ලැබ දස වසරක් ගෙවී ගියේ පසුගිය හතරවැනිදාය. මේ සිද්ධි දෙක අතර සම්බන්ධයක් නැති වුවද කලකින් දකින අයකු මගෙන් අනිවාර්යයෙන් මෙන් අසන ප්‍රශ්න දෙකක් වෙයි. එකක් දැන් මා කුමක් කරන්නේ ද යන්නය. අනෙක රටට කුමක් වන්නේ ද යන්නය. මෙහි දක්වා ඇති මුල් ප්‍රශ්නය මුලින්ම ඇසුවහොත් දෙවැනි ප්‍රශ්නය ඇසීමට අවස්ථාවක් නොදීම මං දැන් හැම ආණ්ඩුවක්ම රට ජාතිය නැති කරන්න අර අදින හැටි ඉගෙන ගන්නවා යැයි කියමි. සිද්ධි අතර මෙන්ම ප්‍රශ්න අතර ද සම්බන්ධයක් නැති නමුත් වැඩ තහනමත් ආණ්ඩු දෙකත් සම්බන්ධ කරන පුද්ගලයෙක් වෙයි. ඒ මගේ මිත්‍ර ගාමිණී ලක්ෂ්මන් පීරිස් මහතා ය. කුඩා කල සිට ලබා ඇති පුහුණුව අනුව මා සුන්දරත්වය දකින්නේ අසම්බන්ධ (යැයි සිතන) දෑ අතර ඇති එවැනි හෝ සම්බන්ධකම තුළය.

වැඩ තහනම් කර මාස හතරකින් මට රැකියාව අහිමි විය. ඉන් පසු මට අතට කීයක් හෝ ලැබුණේ නම් උපාලි පුවත්පත් සමාගම පළකරන ඉරිදා දිවයින, දිවයින, අයිලන්ඩ්, විදුසර හා කලක් පළ වූ වත්මන යන ප්‍රකාශනවලට ලිවීමෙනි. මුදලක් බලාපොරොත්තුවෙන් නොලීව ද නිකමකු බවට පත් වූ මට ලිවීම නිල වැදගත් කමක් ලබා දුන්නේය. ජාතික හැඳුනුම් පතෙහි ද ගමන් බලපත්‍රයෙහි ද දියණියගේ පාසල සම්බන්ධ කටයුතුවලදී ද වෘත්තීය රැකියාව යන්න සඳහා විරැකියාව යන්න වෙනුවට ජනමාධ්‍යවේදී (ජර්නලිස්ට්) යන්න සඳහන් විය. එහෙත් එයට වඩා වැදගත් වන්නේ පසුගිය අවුරුදු දහය තුළ මා කළ සියලු ගවේෂණවල ප්‍රතිඵල ඒ ප්‍රකාශනවල පළ කිරීමට හැකි වීමය. මේ අවුරුදු දහය තුළ ලිපි හත් අටසීයක් ලියා පළ කර ඇතැයි සිතමි. ඒ සෑම එකක ම අලුත් අදහස් තිබිණි යැයි නොකියමි. එහෙත් විශ්ව විද්‍යාල තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ දී ලකුණු නොලැබුණත් නව මත රාශියක් මේ ලිපිවල අඩංගු වෙයි. විශේෂයෙන්ම සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම හා දෙමළ ජාතිවාදය පිළිබඳ මූලික ප්‍රවාදය නිර්මාණය කර ගැනීමට හැකි වූයේ ඉරිදා දිවයින හා දිවයින පුවත්පත් ඔස්සේය. මෙරට කිසිම උගතකුගෙන් කිසිදු පිළිගැනීමක් ලැබීමට තරම් වැදගත් වුවක් ඒ සංකල්පවල හා ප්‍රවාදවල නොමැති විය හැකි නමුත් ලිපි පළකිරීමට අවස්ථාව ලබා දුන් සියල්ලන්ට මගේ ස්තුතිය පළවෙයි. ඇතැම්හු ඒ ලිපිවලට ගැරහුවෝ ය. බුදු දහම හා විද්‍යාව සම්බන්ධයෙන් මා ලියන්නේ වෙත්තමුණි මහතා ලියා ඇති දේ පමණක් බවත් මාක්ස්වාදය ගැන මා ලියන දෑ ජාතික ව්‍යාපාරයෙහි වෙනත් අය ද ලියා ඇති දේ බවත් පැවසුවේ ජාතික ව්‍යාපාරයෙහිම සිටින්නෙකි.

රැකියා අහිමි වන බොහෝ දෙනාට හා ඔවුන්ගේ පවුල්වලට හිමි වන දුක කම්කටොළු සියල්ල අපට උරුම වූවා නොවේ. රැකියාව අහිමි වන අවස්ථාවෙහි මම කොළඹ විශ්ව විද්‍යාලයෙහි විද්‍යා ආචාර්යවරුන්ගේ සංගමයේ මෙන්ම විශ්ව විද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනයේද සභාපති වීමි. එවකට විශ්ව විද්‍යාල ආචාර්යවරු වැටුප් වැඩි කර ගැනීමෙහි සටනක නිරත වී සිටියහ. වැඩ තහනම් කරනු ලැබ සිටි කාලයේ දී ද නෙරපීමෙන් පසුව ද අවුරුද්දක් පමණ මම සම්මේලනයේ සභාපති පදවිය දැරීමි. රැකියාවෙන් නෙරපනු ලැබීමෙන් පසුව සම්මේලනයේ කටයුතුවලට මට සහභාගි වීමට හැකි වූයේ විශ්වවිද්‍යාලයීය ඉංගිරිසි උපදේශකවරුන්ගේ (ඉන්ස්ට්‍රක්ටර්ස්) සංගමය තම නියෝජිතයා ලෙස මා පත් කරගත් බැවිනි. ඒ සම්බන්ධයෙන් මගේ කෘතඥතාවය ඔරානි ජැන්ස් මහත්මිය ප්‍රධාන ඒ සංගමයට හිමිවෙයි. ජාතික චින්තනය යන්න වැරැදි පැත්තෙන් අල්ලා ගත් ඇතැම්හු මා ඉංගිරිසි උපදේශකවරුන්ගේ සංගමයේ නියෝජිතයා ලෙස කටයුතු කරන්නේ කෙසේ දැයි ප්‍රශ්න කළහ. කෙසේ වෙතත් වැටුප් අරගලය ජයග්‍රහණයකින් කෙළවර විය. රැකියාවෙන් නෙරපනු ලැබීම නිසා මට වැටුප් වැඩිවීම අහිමි වුණද අරගලයෙහි ප්‍රතිඵලයක් ලෙස මගේ භාර්යාවගේ ද වැටුප වැඩි විය. එබැවින් අපට ජීවත් වීම ප්‍රශ්නයක් නොවීය. එහෙත් දරුවන්ගේ අවශ්‍යතා සියල්ල සම්පූර්ණ කිරීමට අපට නොහැකි විය. (අවශ්‍යතා තම මිතුරන්ගේ සමාජයට සාපේක්ෂ ය. මේ ඇතැම් අවශ්‍යතා මෙරට දරුවන් ලක්ෂ ගණනකගේ අවශ්‍යතා නොවන බව මම දනිමි.)

© Prof. Nalin De Silva

පසුගිය අවුරුදු දහය තුළ රැකියාව ලබාදීමට උත්සාහ ගත්තෝ කිහිප දෙනෙක් වෙති. පූජ්‍ය බෙංගමුවේ නාලක හිමි පූජ්‍ය ඕමාරේ කස්සප හිමි, පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි. ගුණදාස අමරසේකර, දිනේෂ් ගුණවර්ධන, විශේෂඥ වෛද්‍ය කමලදාස, අම්බලන්තොට සරත් අබේසිංහ, හම්බන්තොට තාසිම් යන මහත්වරුන් ඉන් ප්‍රධාන වෙති. පූජ්‍ය මෛත්‍රී සුධම්ම හිමි හා ගෙවිඳු කුමාරතුංග මහතා ඇතුළු ඊළඟ පරම්පරාවේ පිරිසක් ඒ සම්බන්ධයෙන් හැකි සෑම දෙයක්ම කළහ. මගේ මිත්‍ර ආචාර්යවරුන් කිහිප දෙනෙක් ද එහිදී වැදගත් කාර්යයක් ඉටු කළහ. විවෘත විශ්වවිද්‍යාලයේ අර්ජුන සොයිසා මහතා හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුතුකුමාරස්වාමි මහතා ඔවුන් අතර පෙරමුණෙහි ම වෙති. ඉරිදා දිවයින හා අයිලන්ඩ් පුවත්පත්වලින් එහිදී ද වැදගත් මෙහෙයක් කෙරිණි. ඒ සියල්ලන්ට මගේ ප්‍රණාමය හිමි වෙයි. එහෙත් එහි දී ප්‍රබුද්ධයන් කටයුතු කළේ වෙනත් ම ආකාරයකටය. කොළඹ විශ්වවිද්‍යාලයේ මා සාමාජිකයකුව සිටි ආචාර්ය සංගම් දෙක අඩුම තරමින් මගේ නෙරපීම පිළිබඳ පැමිණිල්ල ඉදිරිපත් කිරීමටවත් මට අවස්ථාවක් ලබා නොදුන්නේය. මෙය වෘත්තීය සමිති සදාචාරයට හා සම්ප්‍රදායට පටහැනි වූවකි. එහිදී ඒ අසත්කාරයයට නායකත්වය දුන්නවුන් අතර පසු කලෙක දූක්ගන්නාරාළ බවට පත් වූවෙක් හා මානව හිතවාදී ප්‍රබුද්ධයකු වූ දේශපාලන විද්‍යාඥයෙක් වූහ. පියකු දරුවන්ට ඉටු කළ යුතු කාර්යයන් මා අතින් ඉටු නොවෙද්දී ප්‍රබුද්ධයන් මගෙන් ඇසුවේ පුතුන් යුද්ධයට නොයවන්නේ ඇයි ද යන්නය. පුතුන් ඊනියා යුද්ධයට යෑම හෝ නොයෑම හෝ ඔවුන්ගේ කාර්යයකි. ඒ කෙසේ වෙතත් ප්‍රබුද්ධයන්ගේ ආචාර ධර්ම අනුව, තම යුතුකම් ඉටු නොකළ පියකුට දරුවන්ගෙන් ඉල්ලා සිටිය හැක්කේ කුමක්ද? වාසනාවකට ප්‍රබුද්ධයන් මෙන් නොව සිංහල බෞද්ධ සාරධර්ම අගයමින් දරුවෝ මගෙන් ඒ ප්‍රශ්න නොඇසූහ.

මම නිවන පැතුවද වෙස 'සන්තර රජ කෙනෙක් නොවෙමි. එහෙත් මගේ භාර්යාව මන්ද්‍රී දේවියක් වන්නීය. දරුවෝ ජාලිය ක්‍රිෂ්ණජිනා මෙන් වෙති. සමාජය විසින් වනගත කරනු ලැබූ වෙස්සන්තර රජු සමග මන්ද්‍රී දේවිය ද වනගත වූවා ය. වෙස්සන්තර රජු තපස් රකිද්දී සියලු ගැහැට විඳිමින් පල වැල නෙලා ගෙනැවිත් ඇය සැමියා ද දරුවන්ද සෙනෙහසින් රැක බලා ගත්තාය. වනගත කරනු ලැබූ වෙස්සන්තර රජුගෙන් සමාජය බලාපොරොත්තු වූයේ කුමක්ද? සමාජය නියෝජනය කළ ජූජකයා බලාපොරොත්තු වූයේ රජුගේ දරුවන් මෙහෙකාරකමට ලබා ගැනීමට මිස දරුවන්ට උපකාරයක් කිරීමට නොවේ. ජූජක බමුණාගෙන් ගුටි බැට කමින් ගිය ජාලිය ක්‍රිෂ්ණජිනා බේරා ගනු ලැබුවේ සඳමහ රජු විසිනි. අප දරුවන්ට ද උපකාරයට සිටියෝ ඔවුන්ගේ නැන්දලා මාමලා බාප්පලා හා පුංචි අම්මලාය. ඔවුන්ගේ උපකාරයන් අග හිඟයක් නැතිව අප දරුවන් කල් ගෙවනු බව දුටු ඇතැම්හු කැළෑ පත්තර මගින් එයට ප්‍රතිචාර දැක්වූහ. එසේ කළෝ දෙමළ ජාතිවාදීහු නොවූහ. අප දරුවන් ප්‍රාථමික ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය ලැබුයේ හා ලබන්නේ ලංකාවේය. එහෙත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද වරක් ප්‍රසිද්ධියේ පැවසුවේ ඔවුන් පිටරට ඉගෙන ගන්නා බවය. එක් දරුවකු මෙරට එක් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීමෙන් පසුව ද අප ඔහු එහි නොයැවූයේ එහි වූ ජූජකයන් නිසාය. මුළු සමාජයම ජූජකයන්ගෙන් පිරී ඇතැයි මින් අදහස් නොවන බව අවධාරණය කළ යුතුය.

අවුරුදු දහයක් මම එක්තරා ආකාරයක තපසක් රැක්කෙමි. වසර දෙකකට පෙර භාර්යාව සජ්ත වාර්ෂිකව නිවාඩුව සඳහා මලාවි විශ්වවිද්‍යාලයේ පත්වීමක් ලැබ මලාවියට ගිය අවස්ථාවේ දී මම ද එහි ගියෙමි. එහෙත් මාස හතරකින් අපි ආපසු ආවෙමු. ඒ හැරෙන්නට අපි පසුගිය අවුරුදු දහය තුළ රටින් පිට ව ජීවත් නොවීමු. එහෙත් ඇතැම්හු පසුගිය කාලෙ රටේ හිටියෙ නෑ නේ ද කියා මගෙන් ප්‍රශ්න කරති. ඔවුන් රට කියන්නේ කුමකට දැයි මා නොදන්නා බව පමණක් මම ඔවුන්ට පවසමි. මේ කාලය තුළ මා වැඩි වශයෙන් කළේ රට ජාතිය සමය ගැන හැදෑරීමය. එමගින් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට විශේෂයෙන් ම එහි සංස්කෘතික සංරචකය අප රටට කරන විපත ගැන යම් අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ප්‍රංශ මැක්කන් කුමක් කීවද, බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ක්‍රිස්තියානි නොකියා කුමක් කියන්නද? මලාවියේ සිටි කාලයේ මෙය වඩාත් කාර්යක්ෂම ව ක්‍රියාත්මක වන ආකාරය දුටුවෙමි. අපේ රටේ මිනිසුන් මේ යටත්විජිතවාදයෙහි ගොදුරු වී පිස්සු කෙළින බව අපි දනිමු. අප්‍රිකානුවෝ බහුතරයක් තමන් පිස්සු කෙළින බවවත් නොදනිති. නෙල්සන් මැන්ඩෙලා සුද්දන්ගේ මෙතරම් ගෞරවයට පාත්‍ර වන්නේ ඇයි? ඔහු අද රඟ පාන්නේ සුදු මහත්තයාගේ හා රාජ්‍ය පාලකයාගේ (ජෙන්ට්ල්මන් ඇන්ඩ් ස්ටේට්ස්මන්) චරිතයයි. රුෂ්ඩිලාට අරුන්දතී රෝයිලාට සුද්දන් තෑගි පිරිනමන්නේ ඇයි? අපේ අයට දෙන ජාත්‍යන්තර තෑගි එතරම් ලොකු නොවූවත් ඔවුන්ට එලෙස තෑගි ලැබෙන්නේ ඇයි? ඒ ඊනියා කලාවකට හෝ සාමයට හෝ නොවේ. මේ සියල්ලෝම අවසාන වශයෙන් ගත් කල බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියේ ව්‍යාප්තිය වෙනුවෙන් සේවය කරති. ඔවුන් අතින් ගැරහීමට පිළිකුළට ලක්වන්නේ

© Prof. Nalin De Silva

ආසියා අප්‍රිකා සංස්කෘතීන්ය. අපේ ආරක්ෂාව සඳහා මන්ත්‍රයක් මෙන් කියවිය යුතු දෙයක් වෙයි. එනම් සුද්දන්ගේ ගෞරවයට පාත්‍රවන්නන්, විශේෂයෙන් ම සාහිත්‍යය ඇතුළු කලාවෙහි මානව හා සමාජයීය විද්‍යාවන්හි හා දේශපාලනයෙහි ගෞරව ලබන්නවුන් දෙස සැක සිතින් බලමු යන්නය.

පසුගිය ආණ්ඩුව මෙන්ම මේ ආණ්ඩුවද ක්‍රියා කරන්නේ බටහිරයන්ගේ ඒජන්තයන් ලෙස ය. ජී. එල්. පීරිස් මහතා ආණ්ඩු දෙකෙහිම ඔවුන්ගේ සුපිරි ඒජන්තයාය. ඔහු වැඩ පටන් ගත්තේ කොළඹ විශ්වවිද්‍යාලයෙනි. ප්‍රභාකරන් හා දෙමළ ජාතිවාදය පිටුපස ඇත්තේ ඇමරිකන් කුමන්ත්‍රණයක් නොවේ. මේ පසුගිය අවුරුදු පන්සියයක් තුළ ලෝකයේ ක්‍රියාත්මක වන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි එක් කොටසක් පමණකි. සිංහලත්වය නැති කිරීම සඳහා අවුරුදු සිය ගණනකට වැඩි කාලයක් තිස්සේ බටහිරයෝ තමන් විසින් නිර්මාණය කෙරී බෞතීස්ම කරනු ලැබූ දෙමළ ජාතිවාදය යොදා ගනිති. ගෝලීයකරණය නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි මේ යුගයෙහි නායකත්වය දරන්නේ ඇමරිකාවය. ඉන් පසු ඇත්තේ අනෙක් ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි රටවල්ය.

නොර්වේ ඇතුළු ස්කැන්ඩිනේවියානු ක්‍රිස්තියානු රටවල් ඇංග්ලො සැක්සන් රටවල දඩ බල්ලන් පමණකි. ඊනියා කාලකන්නි යුද්ධය වෙනුවට කාලකන්නි සාමයක් ඇති කිරීමට ආණ්ඩුව බටහිර අනුග්‍රහය තුළ ක්‍රියාත්මක වෙයි. ඇංකරයන්ට කාලකන්නි සාමය යන්න මගේ ඊනියා ජාතිවාදය පිළිබිඹු කරන තවත් ප්‍රකාශනයක් වනු ඇත. එහෙත් රට බෙදා සිංහලත්වයට හිමි තැන අහිමි කරමින් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සිරකරුවන් වෙමින් රටවල් දෙකක් අතර කෙරෙන යුද්ධයකට මග පාදමින් ඇති කිරීමට බලාපොරොත්තු වන ඊනියා සාමය කාලකන්නි සාමයක් නොවන්නේද? සාමයට කැමති කිසිවෙක් කාලකන්නි සාමයට කැමති නොවෙති.

පස් වැනිදා ආණ්ඩුවට සඳු මහා දශාවෙහි සඳු අතුරු දශාව එළඹුණි. මේ සඳු චන්ද්‍රයා නොව චන්ද්‍රිකාය. ජනාධිපතිනියට දැන් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකිය. එහෙත් ඇය දැන්ම එසේ කරාවි යැයි සිතිය නොහැකිය. අද ඉන්දියාව නැවත වරක් මෙරට ගැන සැලකිල්ලක් දක්වයි. ඉන්දියාව නොවන්නට ඔස්ලෝ නාඩගමේදී ඇමරිකාවේ රිචඩ් ආර්මිටේජ් හා බ්‍රිතානියේ ක්ලෙයා ෂෝට් බාලසිංහම් හා පීරිස් සමග රංගනයක යෙදීමට ඉඩ තිබුණි. ඇංග්ලො සැක්සන් රටවල කෝටි තහනම බැරෑරුම් විහිළුවක් පමණකි. මේ අතර මුස්ලිම් කොංග්‍රසයේ භේද උත්සන්න වෙමින් පවතියි. මේ භේදය පිටුපස ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත් එක් කරන්නේ ද නැත් ද යන්නය. උතුර හා නැගෙනහිර එක් කිරීමට අවශ්‍ය වන්නේ මෙරට ජනගහණයෙන් 6% ට අඩු කොටසකටය. ඩග්ලස් දේවානන්ද විසින් නියෝජනය කෙරෙන දෙමළ ජනයාට ද එය අනවශ්‍යය ඉන්දියාවට ද ඒ අනවශ්‍ය වෙයි. එහෙත් බටහිරයන්ගේ යටත්විජිතවාදී අවශ්‍යතාවයන් සපුරාලීමට රටේ 94% කට වැඩි කොටසකගේ හා දකුණු ආසියා කලාපයේ මතයට පටහැණිව ආණ්ඩුව ඒ පළාත් දෙක එක් කර ප්‍රභාකරන්ට දීමට කටයුතු කරයි.

ශ්‍රී. ල. නි පක්ෂයට සිංහල ජන මතයේ රශ්නය දැනෙන්නට පටන් ගෙන ඇත. කුමාරතුංග මහත්මිය ජනාධිපතිනිය වුයේ සිංහලයන්ගේ ඡන්දයෙන් බව අපි පැහැදිලි කෙළෙමු. එමෙන්ම පසුගිය මහා මැතිවරණයේ දී සිංහල ඡන්දවලින් බහුතරය ලැබුණේ පොදු පෙරමුණට හා ජනතා විමුක්ති පෙරමුණටය. ඒ බව ශ්‍රී. ල. නි. පක්ෂය මෙන් ම ජ. වි. පෙ ද අවබෝධ කර ගත යුතුය. ජවිපෙ ක්‍රියාකාරිකයෝ තවමත් මාක්ස්වාදි මත දරති. මාක්ස්වාදය යනු බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි ප්‍රධානම අවිය වෙයි. මාක්ස්වාදයෙන් කෙරෙන ප්‍රධානම කාර්යය ඒ ඒ රටවල ජාතිකත්ව නැති කිරීමට ආධාර කිරීමය. අද කළ යුත්තේ පොදු පෙරමුණෙන් ත්‍රිරෝද කරුවන් ලෙස අනුර බණ්ඩාරනායක මහතා හඳුන්වන ලසසප හා කොප ඉවත් කර තිලක් කරුණාරත්න, හරිශ්චන්ද්‍ර විජේතුංග මහත්වරුන් ප්‍රමුඛ පිරිස එයට සම්බන්ධ කර ගැනීමය.

බටහිර පදයට නැටූ ජයවර්ධන ආණ්ඩුවට එරෙහිව ඉන්දියාව කටයුතු කළේය. මේ ආණ්ඩුවද බටහිරයන්ට යට වී ඉන්දියාවට මැදිහත් වීමට වක්‍රව ආරාධනා කරයි. ඉදිරි අවුරුදු දෙක මෙරට මෑත ඉතිහාසයෙහි තීරණාත්මකම අවධිය වෙයි. කුමාරතුංග මහත්මියගේ ජනාධිපතිවරය ඒ අවුරුදු දෙක තුළ අව පක්ෂයට යයි. ඉන්දියාවේ මැතිවරණයක්ද එළඹෙනු ඇත. අපට තවමත් ඇත්තේ බටහිර යටත්විජිතවාදයෙන් නිදහස් වීම පිළිබඳ ප්‍රශ්නයයි. එහි දී අපේ දැනුමක් නිර්මාණය කළ යුතු වෙයි. පසුගිය අවුරුදු දහය තුළ ඒ පිළිබඳ යමක් කිරීමට හැකි වීම ගැන

© Prof. Nalin De Silva

මම සතුටු වෙමි. සිංහලයන් අනුකාරකයන් නොවන්නේ නම් වැඩි කලක් නොගොස් ජයගනු ඇත. අද අපට ඇති ප්‍රධානම තර්ජනය අනුකාරකත්වය හා බටහිර යටත්විජිතවාදයේ ඒජන්තයන් වූ අනුකාරක උගතුන්ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva